**ඒරාවූර් නගර සභාව - 2023**
**--------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ඒරාවූර් නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ,නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ඒරාවූර් නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

#### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාල පොලී ආදායම් එකතුව රු.319,880ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරියේදී ලැබිය යුතු පොලී ආදායම් ලෙස දක්වන බව. | වර්ෂයට අදාළ ලැබිය යුතු ආදායම් ගිණුම්ගත කළ යුතුය. |

#### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.237,953,471ක් වටිනා ගිණුම් ශේෂ 06කට අදාල ස්ථාවර වත්කම් ලේඛනය, හිමිකාරීත්වය සනාථ කිරීම් ලේඛන, අත්තිකාරම් ලේඛනය සහ අනෙකුත් ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි, පිරියත, මෝටර් රථ, ගෘහභාණ්ඩ ආදියෙහි වටිනාකම තක්සේරු කිරීමට සහ වාහනවල අයිතිය පවරා ගැනීමටත් කටයුතු කරනු ලබන බව. | වත්කම්වලට අදාල ලිඛිත සාක්ෂි ලබාගැනීමට සහ ලේඛනවල ඇතුළත් කිරීමටත් පියවර ගත යුතුය. |

## 1.7 අනුකූල නොවීම

### 1.7.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **නගර සභා ආඥා පනතේ (255 අධිකාරිය)** | | | |
| (i) | 44, 46 හා 49 වගන්ති | සභාව විසින් නඩත්තු කරනු ලබන මාර්ග 628ක් ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොතිබුණි. | සියලුම මාර්ග ගැසට්පත්‍රයේ ප්‍රසිද්ධ කිරීමට පියවර ගත යුතුය. |
| (ii) | 170(1) හා (2) වගන්ති | සමාලෝචිත වර්ෂ අවසානය දක්වා තක්සේරු කළ නිශ්චල දේපළ 10,807කින් රු.10,000ට අධික හිඟ ශේෂ පවතින දේපළ හිමිකරුවන් 304ක ගෙන් රු.6,063,395ක් හිඟ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වරිපනම් බදු නොගෙවූ දේපළ හිමිකරුවන්ගේ කසළ ඉවත් කිරිම නවතා දැමීමට තීරණය කර ඇති බව. | හිඟහිටි වරිපනම් බදු අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 371(2)(අ) | සභාවේ 1988 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා ලබාදී තිබුණු අත්තිකාරම් එකතුව රු.399,386ක් නිරවුල් කර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | අත්තිකාරම් නිරවුල් කිරීමේ ක්‍රියාමාර්ග අඛණ්ඩව සිදුකරමින් පවතින බව. | අත්තිකාරම් ගෙවීම් හඳුනාගෙන පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 571(1), (2) හා (3) | වර්ෂ 02කට වඩා වැඩි කල් ඉකුත් වූ රු.2,536,116ක විවිධ තැන්පතු 11ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. | වර්ෂ 02කට වඩා වැඩි තැන්පතු ආදායම් ගිණුමට මාරු කර ඇති අතර අදාල අයටත් ලබාදී ඇති බව. | කල් ඉකුත් වූ තැන්පතු නිරවුල් කිරීමට පියවර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 6,849,118ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 8,726,921 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව නගර සභාව විසින් ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම | රැස්කළ ආදාය | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදාය | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 13,393,510 | 37,471,865 | 15,228,233 | 22,243,632 | 11,311,941 | 11,877,209 | 12,035,593 | 20,632,517 |
| කුලී | 13,510,800 | 11,530,679 | 5,876,910 | 5,653,769 | 14,130,400 | 4,898,114 | 4,580,713 | 5,973,759 |
| බලපත්‍ර ගාස්තු | 11,074,000 | 5,521,180 | 5,407,180 | 114,000 | 3,650,000 | 2,754,705 | 2,754,705 | - |
| වෙනත් ආදායම් | 16,731,850 | 18,426,088 | 15,738,024 | 2,688,064 | 27,589,466 | 104,382,212 | 104,273,416 | 8,875,257 |
| | 54,710,160 | 72,949,812 | 42,250,347 | 30,699,465 | 56,681, 807 | 123,912,240 | 123,644,427 | 35,481,533 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ බිල්කළ වරිපනම් හා බදු රු.37,471,865කින් රු.15,228,233ක් පමණක් අයකර තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | හිඟහිටි ආදායම් අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන දක්වා කාල පරිච්ඡේදයට අදාලව කුකුළු මස්කඩ 34කින් අයවිය යුතු අපද්‍රව්‍ය ඉවත්කිරී මේ හිඟහිටි බදු රු.484,547ක් සහ විනෝද බදු රු.177,856 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මිය යාම සහ විදේශගත වීම හේතුවෙන් අයකර ගැනීමේ හැකියාව ඉතා අඩු මට්ටමක පවතින බව.<br>එසේම, සිනමා ශාලා හිමිකරු විදේශ රටක් පදිංචිව සිටින බැවින් මෙම හිඟමුදල් අයකර ගත නොහැකිව පවතින බව. | නියමිත හිඟ ආදායම් අදාල කාලවකවානු තුළ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | **කුලී** | | |
| (i) | ඒරාවූර් නව වෙළෙඳ පොල කඩකාමර සංකීර්ණයෙහි පිහිටි කඩකාමර කුලීහිමියන් 15ක ගෙන් අයවිය යුතු රු.311,350ක් වර්ෂ 05කට අධික කාලයක සිට අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | හිඟමුදල් අයකිරීමට කටයුතු කරනු ලබන බව. | හිඟහිටි ආදායම් අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |
| (ii) | 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන දක්වා ගවමස් කඩ 16ක්, එළුමස් කඩ 02ක් සහ කුකුළුමස් කඩ 12කින් අයවිය යුතු හිඟකුලී රු.747,523ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | මෙම මුදල අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | දීර්ඝකාලීන මස්කඩ හිඟහිටි බදුකුලී අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා ලංසු මත පොදු වෙළෙඳ පොල සහ කාන්තා පොල බදු දීමෙන් ලැබිය යුතු රු.5,067,459ක් පසුගිය වර්ෂ 02කට අධික කාලයක සිට අයකර නොතිබුණි. | පුද්ගලයින් හඳුනා ගැනීමේ ගැටළු හේතුවෙන් මෙම හිඟමුදල් අයකර ගැනීම දුෂ්කර වී ඇති බව. | හිඟහිටි ආදායම් අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය සඳහා වෙළෙඳ බලපත්‍ර ගාස්තු රු.114,000ක් සහ දුරකථන සන්නිවේදන කුළුණු සඳහා බලපත්‍ර ගාස්තු රු.45,000ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | වෙළෙඳ බලපත්‍ර ගාස්තු අයකිරීමට කටයුතු කර ඇති බව. | වෙළෙඳ බලපත්‍ර ගාස්තු අදාල පාර්ශවවලින් අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2018 සහ 2019 වර්ෂවල එළුවන් සහ ගවයින්ගේ හම් විකිණීම මත පුද්ගලයෙකුගෙන් අයවිය යුතු රු.141,000ක් වර්ෂ 03කට අධික කාලයක් අයකර නොතිබුණි. | හිඟමුදලින් කොටසක් ගෙවන බව දන්වා ඇති බව | එළුවන් සහ ගවයින්ගේ හම් විකිණීම මත ආදායම් අයකර ගැනීමට පියවර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1952 ඔක්තෝබර් 03 දිනැති අංක 10459 දරන ගැසට් පත්‍රයෙන් අංක A 1695 දරන සැලැස්ම මගින් ඒරාවූර් නගර සභාව විසින් පවරාගෙන තිබූ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතන ගොඩනැගිල්ල පිහිටි ඉඩම විධිමත්ව එම ආයතනයට බදුදීමට හෝ මෙම ඉඩම් නීතිමය ක්‍රියාමාර්ග මගින් ආපසු ලබාගැනීමට පියවර ගෙන නොතිබුණි. | මඩකලපුව දිස්ත්‍රික් ලේකම්වරයාගේ පිළිතුරු ලැබූ පසුව අදාල ආයතනය සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගනු ලබන බව. | ඉඩම බදුදීමට හෝ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) | 2017 වර්ෂයේ පාර්ලිමේන්තු රාජ්‍ය ගිණුම් කාරක සභාව (**COPA**) විසින් අනාවරණය කර තිබූ කාරණා වන අනුමත නොවූ කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම සහ සංස්කෘතික ශාලාව කුලියට දීම සම්බන්ධ නිර්දේශ පසුගිය වර්ෂ 06ක සිට නිවැරදි කිරීමට පියවර ගෙන නොතිබුණි. | -එම- | පාර්ලිමේන්තු රාජ්‍ය ගිණුම් කාරක සභාව (**COPA**) විසින් ලබාදුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | පැරණි වෙළෙඳපොල කඩකාමර 33කින් අයකළ යුතු විදුලි ගාස්තු රු.367,250ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර නොතිබුණි. | හිමිකරුවන්ගෙන් මෙම හිඟමුදල් අයකර ගැනීමට පියවර ගනු ලබන බව. | විදුලි ගාස්තු අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| (ඈ) | විදුලිබල මණ්ඩලයට ලබාදුන් අත්තිකාරම් රු. 786,122ක් අයකර ගැනීමට දීර්ඝකාලයක සිට පියවර ගෙන නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | විදුලිබල මණ්ඩලයට ලබාදුන් අත්තිකාරම් අයකර ගැනීමට පියවර ගත යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල නමට වූ වාහන 02ක් පවරා ගැනීමට සහ එහි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමටත් පියවර ගෙන නොතිබුණි. | වාහනවල අයිතිය සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | සභාව සතු වත්කම් නිරවුල් කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාවේ දීර්ඝකාලයක සිට දෝෂයට ලක්වූ වාහන 05ක් අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට හෝ පසුගිය වර්ෂ 05ක සිට පියවර ගෙන නොතිබුණි. | දීර්ඝකාලයක සිට අළුත්වැඩියා කිරීමට නොහැකි වාහන අපහරණය සඳහා කටයුතු කරමින් පවතින බව. | වාහන අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට පියවර ගත යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ ප්‍රථමික මට්ටමේ පුරප්පාඩු 23ක්ද, ද්විතියික මට්ටමේ තනතුරු පුරප්පාඩු 10ක් වශයෙන් තනතුරු 33ක් පුරප්පාඩුවී තිබීමෙන් පොදු ජනතාවට සපයනු ලබන සේවාවන් දුර්වල තත්ත්වයේ පැවැතුණි. | පුරප්පාඩු පිළිබඳ විස්තර මාසිකව අදාල බලධාරීන්ට යවනු ලබන බව. | පුරප්පාඩු පිරවීමට සුදුසු ක්‍රියාමර්ග ගත යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1988 අංක 56 දරන පනතින් 2000 අංක 53 දරන පනතින් හා 2008 අංක 01 දරන පනතින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත සහ 2022 ජනවාරි 27 දිනැති අංක 2264/18 දරන විශේෂ ගැසට් පත්‍රයේ "ආ" වගන්තිය ප්‍රකාරව සාතකාගාර, ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථාන සහ බේකරි 27ක් සඳහා පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | සාතකාගාර, ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථාන සහ බේකරි සඳහා පරිසර බලපත්‍ර ලබා ගැනීමේ කටයුතු සිදුවෙමින් පවතින බව. | පනතේ ප්‍රකාරව පරිසර බලපත්‍ර ලබාගත යුතුය. |